අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව

# 05

# මොඩියුලය

# දින සටහන්, සති සටහන්, වාර සටහන් හා පාඩම් සටහන් පිළියෙල කිරීම හා පවත්වා ගෙන යාම

2015

සැකසුම පී. එල්. කළුආරච්චි මහත්මිය
එච්. එම්. චන්ද්‍රසේකර මහතා

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

# අරමුණු

1. ඉගැන්වීමේ කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම අවධාරණය කර ගැනීම
2. ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සැලසුම් කිරීමේ විවිධ ප්‍රවේශයන් හඳුනා ගැනීම
3. වාර සටහන් ලිවීමේ හැකියාව ලබා ගැනීම
4. සති සටහන් ලිවීමේ හැකියාව ලබා ගැනීම
5. දින සටහන් සැලසුම් කිරීමේ හැකියාව ලබා ගැනීම
6. විවිධ ප්‍රවේශයන්ට අනුව පාඩම් සටහන් ලිවීමේ කුසලතා සංවර්ධනය කිරීම

# අපේක්ෂිත ඉගෙනුම් පල

1. ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
2. වාර සටහන් නිවැරදි ව සැලසුම් කරයි.
3. සති සටහන් නිවැරදි ව සැලසුම් කරයි.
4. දින සටහන් නිවැරදි වසැලසුම් කරයි.
5. පාඩම් සටහන් ලිවීමේ විවිධ ප්‍රවේශ විස්තර කරයි.
6. එක් එක් ප්‍රවේශ ආකෘති අනුව පාඩම් සටහන් සකස් කරයි.

| | | | |
|---|---|---|---|
| **සැසි 01** | **ඉගැන්වීමේ කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදි යොදා ගන්නා විවිධ සැලසුම් හැදින්වීම** | | |
| **සැසි 02** | න්‍යායාත්මක පදනම | - | පැය 04 |
| **සැසි 02** | වාර සටහන් ලිවීම | - | පැය 04 |
| **සැසි 03** | දින සටහන් ලිවීම | - | පැය 04 |
| **සැසි 04** | පාඩම් සැලසුම් කිරීම | - | පැය 04 |
| **සැසි 05** | පාඩම් සැලසුම් ලිවීම | - | පැය 04 |
| | | | --------- |
| | | | **පැය 20** |
| | | | ===== |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහයේ සමඟ එක්වන්න...

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

## සැසි සැලැස්ම

| සැසිය | මාතෘකාව | විෂය අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 01 | ඉගැන්වීමේ කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම | • සැලසුම් කිරීම පැහැදිලි කර ගැනීම<br>➢ ඉදිරියට කළ යුතු දේ කලින් තීරණය කොට ඒ සඳහා වන සූදානම<br>➢ "අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන ඉලක්ක වෙත ළඟා වීම සඳහා සකසනු ලබන විධිමත් වැඩ සැලසුම"<br>➢ ශිෂ්‍යයන්ට ලබා දිය යුතු ඉගෙනුම් අත්දැකීම් නිවැරදි ව වටහා ගැනීම<br>➢ ඉගැන්වීමේ ද්‍රව්‍ය කලින් සූදානම් කර ගත හැකි වීම<br>➢ විෂය ගැටලු කලින් හඳුනා ගෙන විසඳා ගැනීම<br>➢ නියමිත දිනට විෂය නිර්දේශ නිම කළ හැකි වීම<br>➢ ඉලක්ක වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව<br>• ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයා සැලසුම් කරනු ලබන විවිධ සැලසුම්<br>• වාර්ෂික සැලසුම්<br>• වාර සටහන්<br>• ඒකක සටහන්<br>• දින සටහන්<br>• පාඩම් සටහන්<br>මෙම සැලසුම් වර්ග කෙටියෙන් හැඳින්වීම | | සාකච්ඡා<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ගුරු සිසුන් සමඟ සාකච්ඡා මඟින්<br>සාකච්ඡා මගින් | |
| | වාර සටහන් ලිවීම | • වාර සටහන් ලිවීමට අවශ්‍ය දෑ<br>✓ කාල සටහන<br>✓ විෂය නිර්දේශ / ගුරු අත්පොත්<br>✓ දින දර්ශනය | • පාසලක වාර්ෂික සැලැස්ම | • කණ්ඩායම් වැඩ<br>• ප්‍රාථමික, ද්විතියික විෂය ගණිතය | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ✓ පාසල් දින දර්ශනය<br><br>• වාර සටහනක මූලික ආකෘතිය<br><br>1. විෂය<br>2. ශ්‍රේණිය<br>3. කාලච්ඡේදය<br>4. නිපුණතාව<br>5. නිපුණතා මට්ටම<br>6. මාතෘකාව/ක්‍රියාකාරකම්<br>7. යෝජිත දිනය<br>8. ඉටු කළ දිනය<br>9. වෙනත්<br><br>• මෙය සැකසිය යුතු ය.<br>• විදුහල්පති ලවා අනුමත කර ගත යුතු ය. | • පාසල් දින දර්ශනය<br><br>• ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය<br>• පෙළ පොත් | සිංහල<br>විද්‍යාව<br>ආදි ලෙස<br>කණ්ඩායම් කළ යුතු ය.<br>• ඉදිරිපත් කිරීම<br>• සාකච්ඡාව | |
| | **සති සටහන් ලිවීම** | සති සටහන් ලිවීමට අවශ්‍ය ආකෘතිය<br><br>❖ දිනය<br>❖ විෂය<br>❖ මාතෘකාව<br>❖ කාල පරිච්ඡේදය<br>❖ නිපුණතාව<br>❖ නිපුණතා මට්ටම<br>❖ අපේක්ෂිත දිනය<br>❖ නිම කළ දිනය<br>❖ වෙනත් | • සති සටහන් ආකෘති<br>• ගුරු මාර්ගෝපදේශය<br>• පෙළ පොත්<br>• කාල සටහන පාසලේ වාර්ෂික සැලැස්ම | • දේශන සාකච්ඡා<br>• කණ්ඩායම් වැඩ<br>• ඉදිරිපත් කිරීම් සමාලෝචන සාකච්ඡා | පැය 04 |
| | **දින සටහන්** | • දින සටහන් ලිවීමට අවශ්‍ය දෑ පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම<br>• විෂය නිර්දේශ<br>• ගුරු අත්පොත්<br>• පෙළ පොත්<br>• කාල සටහන<br><br>• දින සටහනක ආකෘතිය<br><br>1. දිනය<br>2. ශ්‍රේණිය<br>3. විෂය<br>4. කාලච්ඡේදය<br>5. මාතෘකාව<br>6. නිපුණතාව<br>7. නිපුණතා මට්ටම<br>8. විෂය අන්තර්ගතය<br>9. ගුණාත්මක යෙදවුම්<br>10. ප්‍රතිපෝෂණ | • විෂය නිර්දේශ<br>• ගුරු අත්පොත්<br>• පෙළ පොත් කාල සටහන් ආකෘති | • දේශන, සාකච්ඡා<br>• කණ්ඩායම් වැඩ<br>• ඉදිරිපත් කිරීම් සමාලෝචනය | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • මෙය වගුවක් ලෙස සකසා ගත යුතු ය.<br>• දින සටහන හැකි තරම් සංක්ෂිප්ත විය යුතු ය. | | | |
| 02 | පාඩම් සැලසුමට අදාළ න්‍යායික පදනම | **බ්ලූම්ගේ අරමුණු වර්ගීකරණය**<br>1. ප්‍රජානන ක්ෂේත්‍රය (Cognitive Domain)<br>2. ආවේදන ක්ෂේත්‍රය (Affective Domain)<br>3. මනෝ චාලක ක්ෂේත්‍රය (Psychomotor Domain)<br>• මේ එක් එක් ක්ෂේත්‍රය ඔහු සවිස්තර ව දක්වා ඇත.<br>• බ්ලූම්ගේ වර්ගීකරණයට සංශෝධන<br>ඉහත සඳහන් ක්ෂේත්‍ර 03ට අමතර ව පහත සඳහන් ක්ෂේත්‍ර 02 ද ඇතුළත් කරනු ලැබී ය.<br>4. සමාජ කුසලතා<br>5. පෞරුෂ ගති ලක්ෂණ<br>• පාඩම් සැලසුමක අරමුණු ලිවීමේ දී ඉහත ක්ෂේත්‍ර 05 ගැන ම අවධානය යොමු කළ යුතු වේ.<br>• අරමුණු පාදක ව පාඩම් සැලසුම් කරන විට ඉහත ක්ෂේත්‍ර ගැන අවධානය යොමු කොට අරමුණු ලිවිය යුතු ය.<br>• අරමුණු ලිවීම<br>➢ අරමුණු ලිවීමේ දී ශිෂ්‍ය චර්යා ප්‍රකාශ වන පරිදි ලිවිය යුතු ය.<br>➢ චර්යාත්මක අරමුණු ලිවීමේ දී ශිෂ්‍යයා කරන දෙයට අදාළ තත්ත්වය (Condition) හා එහි අපේක්ෂිත ප්‍රමිතිය (Standard) උචිත ක්‍රියා පදයක් යොදා ලිවිය යුතු ය. | • අත් පත්‍රිකා 01<br>• පැවරුම් 01<br>• ඩිමයි කොළ<br>• පෑන් | • දේශන සාකච්ඡා<br>• කණ්ඩායම් 04ට බෙදා පැවරුමේ සඳහන් ක්‍රියාකාරකම් 04 එක් කණ්ඩායමකට 01 බැගින් ලබා දීම<br>• ඉදිරිපත් කිරීම<br>• සමාලෝචන සාකච්ඡා | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමඟ එක්වන්න...

| | | | | | |
|---|---|---|---|---|---|
| | | උදා. කණ්ඩායම සමඟ සහයෝගයෙන් පාසල් වත්තේ පස සේදී යාමට බලපාන කරුණු 03ක් නිරීක්ෂණය කොට වාර්තා කරයි.<br><br>➢ අපේක්ෂිත තත්ත්වය - කණ්ඩායම සමඟ සහයෝගයෙන්<br><br>➢ පිළිගත හැකි ප්‍රමිතිය - බලපාන කරුණු 03ක්<br><br>➢ උචිත ක්‍රියා පදය - නිරීක්ෂණය කොට වාර්තා කරයි.<br><br>* මෙලෙස අරමුණු ලියන විට එම අරමුණුවල පහත ලක්ෂණ මතු වේ.<br><br>■ ශිෂ්‍ය චර්යාව ප්‍රකාශ වේ.<br>■ එය දැකිය හැකි වේ.<br>■ එය මැනීමට හැකි වේ. | | | |
| | | නිර්මාපී ඉගෙනුම<br>(Constructivist Learning Design)<br><br>• 2007 ද්විතියික විෂයමාලා ප්‍රතිසංස්කරණ සමඟ හඳුන්වා දුන් 5E පාඩම් සැලසුමට පදනම් වූ න්‍යායාත්මක පදනම හැඳින්වීම සඳහා “නිර්මාපි ඉගෙනුම් ප්‍රවේශය” යන්න භාවිත වේ.<br><br>• මෙහි මූලික හරය ඉගෙනීමට අදාළ දෙය තමා විසින් ම ගොඩ නඟා ගෙන නිර්මාණය කර ගන්නා බව ය. | | | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමඟ එක්වන්න...

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • මෙහි ලක්ෂණ<br>1. ශිෂ්‍යයන්ට පැහැදිලි කර ගැනීමට ඉගෙනුම් අවස්ථාවක් ලබා දීම.<br>2. ඉගෙනුම් ද්‍රව්‍ය සමඟ කණ්ඩායම් කිරීම.<br>3. ශිෂ්‍යයන් දන්නා දෙය සහ ගුරුවරයාට ඉගැන්වීමට අවශ්‍ය දේ අතර පාලමක් (Bridge) ගොඩ නැගීම.<br>4. ප්‍රශ්න හා පැහැදිලි කිරීම් මඟින් ශිෂ්‍යයන් කාර්යයේ නියුතු කිරීම.<br>5. සොයා ගත් හා සාකච්ඡා කළ දේ ඉදිරිපත් කිරීම.<br>6. ඉගෙන ගත් දෙය හඳුනා ගැනීම සඳහා ශිෂ්‍ය ප්‍රතිචාර ලබා ගැනීම.<br><br>**5E ආකෘතිය**<br><br>**I. නියුක්තකරණය (Engagement)**<br>• මේ මඟින් ඉගෙනීමට ශිෂ්‍යයාට සැබෑ අවශ්‍යතාවක් ඇති කරයි.<br>• ප්‍රශ්න, ගැටලු, සිත් ඇද ගන්නා අවස්ථා ඉදිරිපත් කිරීමෙන් මෙය කළ හැකි ය. පිංතූර, කවි, පුවත්පත්, සිද්ධි නිරූපණ මඟින් මෙය අර්ථ ගැන්විය හැකි ය.<br><br>**II. ගවේෂණය - (Exploration)**<br>සිසුහු ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින්, කථා කරමින්, ප්‍රශ්න නඟමින් ඉගෙනීමට ඇති දෑ අනාවරණය කර ගනිති.<br><br>**III. විවරණය (Explanation)**<br>තම කණ්ඩායම සොයාගත් තොරතුරු ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ. | | | පැය 04 |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

| | | | | | |
|---|---|---|---|---|---|
| | | **IV. විස්තාරණය (Elaboration)**<br><br>කණ්ඩායම තුළ ඉගෙන ගත් දෙය තවදුරටත් පුළුල් වේ. ගුරුවරයා ඌන පූරණය මඟින් ඒවා තහවුරු කරයි.<br><br>**V. ඇගයීම (Evaluation/Assessment)**<br><br>II හා III පියවරවල දී ගුරුවරයා තක්සේරුවට අදාළ තොරතුරු රැස් කළ යුතු වේ.<br><br>5E ප්‍රවේශයට අනුව පාඩම් සැලසුම් කිරීමේ දී<br><br>• නිපුනතාව හඳුනා ගත යුතු ය.<br>• නිපුනතාවේ මට්ටම් දැක්විය යුතු ය.<br>• ඉගැන්වීම සඳහා භාවිත කරන ගුණාත්මක යෙදවුම් (Quality Input) දැක්විය යුතු ය.<br><br>* 2015 විෂය නිර්දේශ සඳහා කරන ලද සංවර්ධනය කිරීම්<br>• නිපුණතාව දැක්වීම<br>• නිපුණතා මට්ටම දැක්වීම<br>• ඉගෙනුම් ඵල දැක්වීම<br>• 5E වෙනුවට පාඩම සංවර්ධනය සඳහා විවිධ ප්‍රවේශ භාවිතය | | | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමඟ එක්වන්න...

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | **පාඩම් සැලසුම් කිරීම** | **අරමුණු පාදක ප්‍රවේශය**<br>• පාඩම් සැලසුම් හැඳින්වීම<br>• පාඩම් සැලසුම් පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන<br>• පාඩම් සඳහා ගුරුවරයා විසින් සකස් කරන ලද උපදේශනාත්මක තොරතුරු ඇතුළත් විස්තරාත්මක ලියවිල්ලකි.<br>• ඉගෙනුම්පල ලබා කර ගැනීම සඳහා සකස් කරන ලද ලිඛිත මහ පෙන්වීමකි. එහි සුවිශේෂී අර්ථකථන,මහ පෙන්වීම් සහිත ඉගෙනුම් අරමුණු, උපකරණ ඇතුළත් ක්‍රියාවලියක් අන්තර්ගත වේ. (අධ්‍යාපන විශ්වකෝෂය)<br>• පාඩම් සැලසුමක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු<br>  ◦ සිසුන් පිළිබඳ<br>  ◦ අරමුණු පිළිබඳ (ජාතික පොදු අරමුණු මූලික නිපුණතා විෂය අරමුණු, විෂය නිපුණතා සහ ඉගෙනුම්පල)<br>  ◦ ඉගෙනුම ඵලදායි කිරීමට යොදාගත හැකි සම්පත්<br>  ◦ සිසුන් සඳහා යොදා ගන්නා මග පෙන්වමින් ක්‍රියාකාරකම්<br>  ◦ සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම/ දැනුම තහවුරු කිරීම | විනිවිදක | බුද්ධි කලම්බන සාක්ෂරතාවයන්<br><br>Pp ඉදිරිපත් කිරීම | |
| | | • පාසම් සටහන් වර්ග<br>  - සවිස්තරාත්මක පාඩම් සටහන්<br>  - සංක්ෂිප්ත පාඩන් සටහන් | ඇමුණුම 05 | | |
| | **i.** අරමුණු පාදක ප්‍රවේශය<br><br>**ii.** නිර්මාංපි ඉගෙනුම් ප්‍රවේශය | • පාඩම් සැලසුම්කරණයේ දී විවිධ ප්‍රවේශ සහ ආකෘති යොදා ගනු ලබන බව | | | |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

<table>
<tr>
<td></td>
<td></td>
<td>
ආකෘතිය පහත දැක් වේ.
<ol>
<li>දිනය</li>
<li>ශ්‍රේණිය</li>
<li>විෂය</li>
<li>පාඩම</li>
<li>සුවිශේෂ අභිමතාර්ථ</li>
<li>කාල පරිච්ඡේද</li>
<li>කාලය</li>
<li>සුවිශේෂි අභිමතාර්ථ<br>............................<br>............................<br>............................</li>
<li>ඉගෙනුම් ක්‍රම ශිල්ප<br>............................<br>............................<br>............................</li>
<li>ඉගෙනුම් ආධාරක</li>
<li>පාඩම සංවර්ධනය
<table>
<tr><th>පියවර</th><th>ගුරු ක්‍රියාකාරකම්</th><th>සිසු ක්‍රියාකාරකම්</th></tr>
<tr><td>1.</td><td></td><td></td></tr>
<tr><td>2.</td><td></td><td></td></tr>
<tr><td>3.</td><td></td><td></td></tr>
</table>
</li>
<li>ඇගයීම හා තක්සේරුකරණය</li>
<li>ප්‍රත්‍යවේක්ෂණය</li>
</ol>
</td>
<td></td>
<td></td>
<td></td>
</tr>
<tr>
<td></td>
<td></td>
<td>
• නිර්මාපි ඉගෙනුම් ප්‍රවේශය<br><br>
පාඩම් සැලසුම් ආකෘතිය
<ol>
<li>දිනය</li>
<li>ශ්‍රේණිය</li>
<li>කාලච්ඡේද</li>
<li>විෂය</li>
<li>කාලය</li>
<li>නිපුණතාව</li>
<li>නිපුණතා මට්ටම</li>
<li>ක්‍රියාකාරකම්</li>
<li>ගුණාත්මක යෙදවුම්</li>
<li>ඉගැන්වීමේ ක්‍රියාවලිය</li>
</ol>
</td>
<td></td>
<td></td>
<td></td>
</tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • E 1 නියුක්තකරණය<br>• E 2 ගවේශණය<br>• E 3 විවරණය<br>• E 4 විස්තාරණය<br>• E 5 ඇගයීම<br><br>ඉගෙනුම දීර්ඝ කිරීමේ අත්වැල<br><br>* ඇමුණුම් | • අරමුණු පාදක හා නිර්මාපි ඉගෙනුම් පාඩම් සටහන් ආකෘති (2007,2015)<br>• ගුරු මාර්ගෝපදේශය<br>• පෙළ පොත්<br>• ඩිමයි කොළ<br>• පෑන් | • ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය (2007,2015) පාඩම් සටහන් ආකෘති ඇසුරින්<br><br>• පාඩම් සටහන් ලිවීමේ ආකෘති පුවරුවේ ගොඩ නැංවීම<br><br>• පංතිය කණ්ඩායම් 04ට බෙදා 02ට 01 මාතෘකාව බැගින් මාතෘකා 02ක් කණ්ඩායම් 04ට බෙදා දීම<br><br>• ඉදිරිපත් කිරීම හා සමාලෝචනය | පැය 04 |
| 05 | **පාඩම් සටහන් ලිවීම**<br><br>**2015 නව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව** | 2015 නව ගුරු මාර්ගෝපදේශයට අනුව ක්‍රියාත්මක කළ යුතු පාඩම් සටහන් ආකෘතිය<br><br>1. දිනය<br>2. ශ්‍රේණිය<br>3. විෂය<br>4. පාඩම<br>5. නිපුණතාවය<br>6. නිපුණතා මට්ටම<br>7. අපේක්ෂිත ඉගෙනුම් ඵල<br>8. ගුණාත්මක යෙදවුම්<br>9. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙය ගුරු සිසු ක්‍රියාකාරකම් ලෙස හෝ පාඩම සංවර්ධන පියවර වශයෙන් හෝ පාඩමට යෝග්‍ය ලෙස ක්‍රියාත්මක කළ හැකි ය.<br>10. ඇගයීම හා තක්සේරුකරණය<br>• ප්‍රජානන ක්ෂේත්‍රය<br>• ආවේදන ක්ෂේත්‍රය<br>• මනෝ චාලක ක්ෂේත්‍රය<br>• සමාජ/පෞරුෂ | • ගුරු මාර්ගෝපදේශය<br><br>• පෙළ පොත් | • දේශන, සාකච්ඡා මඟින් ආකෘතිය හඳුන්වා දීම<br>• විෂයයන් අනුව කණ්ඩායම් කිරීම<br>• ක්‍රම දෙකට ම අදාළ ව කණ්ඩායම් වැඩ පැවරීම<br>• ඉදිරිපත් කිරීම, සමාලෝචන, සාකච්ඡා | පැය 04 |

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමඟ එක්වන්න...

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමඟ එක්වන්න...

# 05 මොඩියුලය

## දින සටහන්, සති සටහන්, වාර සටහන් හා පාඩම් සටහන් පිළියෙල කිරීම හා පවත්වා ගෙන යාම

### පාඩම සැලසුම - II

1. දිනය -
2. ශ්‍රේණිය - 5
3. විෂය - මව්බස
4. ඒකකය - සවන් දීම
5. පාඩම - කවි ගීතවලට සවන් දී තාල තබමු.
6. අභිමතාර්ථ - කවි ගීතවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
7. කාලය - විනාඩි 40
8. සුවිශේෂ අභිමතාර්ථ -
   * කවි ගීතවල තාලය වෙනස් බව ප්‍රකාශ කරයි.
   * ළමා කවි හා ගීත වෙන් කර දක්වයි.
   * ළමා කවි හා ගීතවලට සවන් දී වින්දනයක් ලබයි.
   * ළමා කවි හා ගීතවලට සවන් දී තාල තබයි.
   * ළමා කවි හා ගී තාලයට ගයයි.
9. ඉගැන්වීම් ක්‍රම ශිල්ප - ආදර්ශනය, නිරීක්ෂණය, කණ්ඩායම් ක්‍රියාකාරකම්
10. ඉගැන්වීම් ආධාරක -
    * කවි ඇතුළත් කැසට් පට
    * ගීත ඇතුළත් කැසට් පට
    * තාලම්පට
    * කවි ගීත ලියූ පත්‍රිකා
11. පාඩම සංවර්ධනය

| පියවර | ගුරු ක්‍රියාකාරකම් | සිසු ක්‍රියාකාරකම් |
|---|---|---|
| i. | • නැලවිලි ගීයක් ඇසීමට සලස්වයි.<br>• ඒ ගැන විමසමින් පාඩමට පිවිසෙයි. | • අසා වින්දනයක් ලබයි. |
| ii. | • ළමා කවි ඇතුළත් කැසට් පටයක් වාදනය කරයි.<br>• ළමා ගීත ඇතුළත් කැසට් පටයක් වාදනය කරයි. | • කැසට් පටයට සවන් දෙයි.<br>• සතුට පළ කරයි.<br>• කැසට් පටයට සවන් දෙයි.<br>• සතුට පළ කරයි. |
| iii. | • කවි හා ගීතවල තාලයේ වෙනස්කම් ඇති බව සිසුන් හා සාකච්ඡා කරයි. | • සාකච්ඡා කරයි.<br>• කවි හා ගීතවල තාලයේ වෙනස පිළිගනියි. |
| iv. | • පංතිය කණ්ඩායම් 2 කට බෙදීමට උපදෙස් දෙයි.<br>• එක් කණ්ඩායමකට ළමා කවි ඇතුළත් පත්‍රිකාව දී ගායනා කරවයි.<br>• අනෙක් කණ්ඩායමට තාල තබමින්, වින්දනය ලබමින් සවන් දීමට කියයි.<br>• ඊළඟ කණ්ඩායමට ළමා ගීත ලබා දී ගායනා කරවයි. අනෙක් කණ්ඩායමට තාල තබමින්, වින්දනය ලබමින් සවන් දීමට උපදෙස් දෙයි. | • කණ්ඩායම් 2කට බෙදයි<br>• පත්‍රිකාවේ ඇති ළමා කවි ගායනා කරයි.<br>• තාල තබමින් ප්‍රීතිය පළ කරමින් සවන් දෙයි.<br>• ළමා ගීත තාලයකට ගායනා කරයි.<br>• තාල තබමින් ප්‍රීතිය පළ කරමින් සවන් දෙයි. |
| v. | • පාඩම සාරාංශ කරයි.<br>• කවි හා ගීතවල තාල තැබීමේ වෙනස ආදර්ශනය කරයි.<br>• කවි හා ගීතවලට සවන් දීමට සලස්වා වින්දනයක් ලබා දෙයි. | • සවන් දෙයි.<br>• ප්‍රතිචාර දෙයි. |

12. ඇගයීම / තක්සේරුකරණය

| පියවර | ගුරු ක්‍රියාකාරකම් | සිසු ක්‍රියාකාරකම් |
|---|---|---|
| i. | • කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ගායනය හා තාල තැබීමට අදාළ දක්ෂතා නිරීක්ෂණය කර තක්සේරු කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී වින්දනාත්මක සවන් දීම නිරීක්ෂණය කර තකේස්රු කරයි.<br>• තනි තනි ව ශිෂ්‍යයන්ගේ තාල තැබීම නිරීක්ෂණය කොට තක්සේරු කරයි. | • කණ්ඩායමක් ලෙස ගයයි. තාල තබයි.<br>• කණ්ඩායමක් ලෙස සතුටින් සවන් දෙයි.<br>• තනි තනි ව තාල තබයි. |

13. ප්‍රත්‍යාවේක්ෂණය

SLTS - ශ්‍රී ලංකා ගුරු සේවය - Sri Lanka Teachers Service
FB සමූහය සමග එක්වන්න...

ඇමුණුම 02

# දින සටහන

| දිනය | ශ්‍රේණිය | විෂය | කාල ඡේද | මාතෘකාව | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් | ඉගෙනුම් ඵල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2015/ 02/02 | 6 A | සිංහල භාෂාව හා සාහිත්‍යය | 02 | සිංහල අක්ෂර මාලාව | සිංහල අක්ෂර හඳුනා ගෙන ලේඛනයේ දී භාවිත කරයි. | සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • සිංහල අක්ෂර මාලාව<br>• ස්වර, ව්‍යඤ්ජන<br>• සඤ්ඤක අකුරු<br>• මහා ප්‍රාණ අකුරු | • ගුරු අත්පොත<br>• අක්ෂර මාලාව<br>• මුද්‍රිත කාඩ්පත් | • සිංහල අක්ෂර මාලාව ලියයි.<br>• ස්වර වෙන් කරයි.<br>• ව්‍යඤ්ජන වෙන් කරයි.<br>• මහා ප්‍රාණ හා සඤ්ඤක හඳුනයි. |
| | 6 A | ඉතිහාසය | 04 | ආදි මිනිසා | මානව සංවර්ධනයේ විකාශය පෙන්වා දෙයි. | පාරිසරික සාධක මත ජීවීන්ගේ ආරම්භය හා මානවයා බිහි වීම විස්තර කරයි. | • මිනිසා බිහි වූ පරිසරය<br>• පෘථිවිය බිහි වී දිගු කලකට මිනිසා බිහි වීම<br>• ආරම්භයේ පෘථිවිය උණුසුම් ය.<br>• පසු ව සිසිල් විය.<br>• ඉන්පසු ව ජීවීන් හට ගෙන ඇත. | • ගුරු අත්පොත<br>• පෘථිවිය, ජීවීන් පිළිබඳ පිංතූර | • ආරම්භයේ දී පෘථිවිය උණුසුම් බව කියයි.<br>• පසු ව එය සිසිල වූ බව කියයි.<br>• ඉන්පසුව ජීවීන් හට ගත් බව කියයි. |
| | 10 A | සිංහල භාෂාව හා සාහිත්‍යය | 05 | බුත්සරණ | ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | • බුත්සරණ<br>• නාලාගිරි දමනය | • සාහිත්‍ය පාඨ සංග්‍රහය<br>• බුත්සරණ කියවීමේ ශෛලිය අඩංගු හඬ පටයක් | • කියවීමේ දී ශෛලීය විවිධතා හඳුනා ගෙන කියවයි.<br>• නිවැරදි ව ශබ්ද උච්ඡාරණය කරයි. |
| | 10 B | ඉතිහාසය | 06 | ශ්‍රී ලංකාවේ | මානව | ශ්‍රී ලංකාවේ මුල් | • ශ්‍රී ලංකාවේ | • ප්‍රාග් | • ප්‍රාග් හා |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ජනාවාස පිහිටුවීම | සංවර්ධනයේ විකාශය පෙන්වා දෙයි. | ජනාවාසවල මූලිකාංග අධ්‍යයනය කරමින් කාල-අවකාශීය විවිධත්වය පෙන්වා දෙයි. | ජනාවාස පිහිටුවීම<br>• ප්‍රාග් ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 125000 - ක්‍රි.පූ. 1800)<br>• දඩයම හා ආහාර එකතු කිරීමේ යැපීම් ක්‍රමය | ඓතිහාසික යුගය පිළිබඳ ඇති පිංතූර පොත් හා පුවත් පත් | පූර්ව ඓතිහාසික යුග වෙනස දක්වයි.<br>• ප්‍රාග් ඓතිහාසික යුගයේ මානව චර්යා ලක්ෂණ කියයි. |
| | 10 B | සිංහල භාෂාව හා සාහිත්‍යය | 07 | සිංහල අක්ෂර මාලාව | සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | සිංහල අක්ෂර මාලාව විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • ඝෝෂ-අඝෝෂ අක්ෂර<br>• අන්තස්ථාක්ෂර | • අක්ෂර ලිවූ කාඩ්පත් | • ඝෝෂ - අඝෝෂ භේදය හඳුනා ගෙන කියයි.<br>• අන්තස්ථාක්ෂර හඳුනා ගෙන භාවිත කරයි. |
| | 6 B | ඉතිහාසය | 08 | ආදි මිනිසා | මානව සංවර්ධනයේ විකාශය පෙන්වා දෙයි. | පාරිසරික සාධක මත ජීවීන්ගේ ආරම්භය හා මානවයා බිහි වීම විස්තර කරයි. | • මිනිසා බිහි වීමට පෙර ජලයෙහි හා ගොඩබිම විසූ විවධ සතුන්<br>• මුල් ම ජීවීන් මුහුදේ විසූ බව<br>• ඒක සෛලික මුහුදු හතු<br>• ඒක සෛලිකයෝ | • ඉපැරණි ජීවීන් පිළිබඳ විවධ තොරතුරු පුවත්පත්<br>• පිංතූර | • මිනිසා බිහි වීමට පෙර වෙනත් ජීවීන් බිහි වූ බව විස්තර කරයි. |

ඇමුණුම 01

# සති සටහන් ආකෘතිය

| සතියේ දින | කාල පරිච්ඡේද | විෂය | මාතෘකාව | නිපුණතාව | නිපුණතා මට්ටම | අපේක්ෂිත දිනය | නිම කළ දිනය | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| සඳුදා | **1.**<br>**2.**<br>**3.**<br>**4.**<br>**5.**<br>**6.**<br>**7.**<br>**8.** | | | | | | | |
| අඟහරුවාදා | **1.**<br>**2.**<br>**3.**<br>**4.**<br>**5.**<br>**6.**<br>**7.**<br>**8.** | | | | | | | |
| බදාදා | **1.**<br>**2.**<br>**3.**<br>**4.**<br>**5.**<br>**6.**<br>**7.**<br>**8.** | | | | | | | |
| බ්‍රහස්පතින්දා | **1.** | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2.**<br>**3.**<br>**4.**<br>**5.**<br>**6.**<br>**7.**<br>**8.** | | | | | | | |
| සිකුරාදා | **1.**<br>**2.**<br>**3.**<br>**4.**<br>**5.**<br>**6.**<br>**7.**<br>**8.** | | | | | | | |